සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(I)**

| කාලය: පැය 03 | රජයේ මූල්‍ය පරිපාටි- 06 | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |
|---|---|---|

- **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

---

01. I. වංචා දූෂණවලින් තොර වූ මනා රාජ්‍ය පාලනයක් ශක්තිමත් කිරීම වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය කළමණාකරණ ක්‍රියාවලිය තුළ කෙටිකාලීනව හා මධ්‍යකාලීනව සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ කවරේද? (ලකුණු 10)

    II. රාජ්‍ය ආයතනික වියදම් පාලනය සඳහා කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. I. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය වෙනුවෙන් පහත නිලධාරීන්ගේ වගකීම හා කාර්යයභාරය දක්වන්න.

    a. ගණන්දීමේ නිලධාරී

    b. ගබඩා නිලධාරී

    c. ගබඩා භාරකරු (ලකුණු 10)

    II. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවකින් අනාවරණය වන කරුණු කවරේද දක්වා ඒ වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. I. මුදල් රෙගුලාසි 105 (1) අනුව පහත සඳහන් අලාභහානි අවස්ථාවල දී වගකිව යුත්තන්ගෙන් අය කළ හැකි උපරිම අගයන් දක්වන්න.

    a. මුදල්

    b. වත්කම නැතිවීම (සොරකම් කිරීමක් වැනි)

    c. දේපලක් විනාශවීම

    (ලකුණු 2x3=06)

    II. මුදල් රෙගුලාසි 105 (2) අනුව වගකිව යුත්තන්ගෙන් අයකළ හැකි උපරිම අගයන් තීරණය කිරීමේදි සලකා බැලිය යුතු කරුණු දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 06)

III. අලාභහානි වු වත්කම් සම්බන්ධයෙන් පොතෙන් අස් කිරීමේ නියෝගයක් ලබා දීමේදී එකී නියෝගය ලබා දෙන පාර්ශවය විසින් සලකා බැලිය යුතු කරුණු කවරේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. ඔබ සේවය කරනු ලබන ආයතනයක රුපියල් මිලියන 25ට ඇස්තමේන්තු කරන ලද පරිගණක ප්‍රසම්පාදනයක් සලකා බැලීමේ දී;

I. මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් පිළියෙල වන ප්‍රසම්පාදන ගොනුවක ඇතුළත් වන ලේඛන ලැයිස්තුවක් පිළියෙල කරන්න. (ලකුණු 04)

II. ලංසු ලේඛන සමාලෝචනය කර අනුමත කිරීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සලකා බැලිය යුතු කරුණු කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

III. මෙම ප්‍රසම්පාදනයට සම්බන්ධ වන ලංසු විවෘත කිරීමේ කමිටුව පහත කරුණු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

a. ලංසු ආපසු ගැනිම (Withdrawal)

b. ලංසු තොරතුරු කියවීම

c. විවෘත කරන ලද ලංසු නැවත භාරදීම

(ලකුණු 2x3= 06)

05. I. රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ වගකීම හා කාර්යයභාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ විෂය පථය යටතට ගැනෙන වගකීම් හා කාර්යභාරයන් දෙක (02) බැගින් වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. කෙටි සටහන් ලියන්න.

I. මුදල් රෙගුලාසි 135 මූල්‍ය කාර්යය පාලන බලතල පැවරීම

II. අභ්‍යන්තර විගණනය

III. රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තුවේ පාලනය

IV. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

(ලකුණු 5X4=20)

***********